# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2456/84 - 2025 ඔක්තෝබර් මස 04 වැනි සෙනසුරාදා - 2025.10.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : LEI-CDP/SD/M/S-2-2.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/17/2021/LO/81.

ලුනාව පරිසර ප්‍රවර්ධන සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉඩම් අත්කර ගැනීම සඳහා පහත විස්තර කෙරෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :-*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 550, ලක්ෂපතිය දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ලක්ෂපතිය ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද 2025.07.31 දිනැති කැඩැස්තර සිතියම් අංක 520210 හි කළාප 18 පත්‍ර අංක 08 සහ පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුවෙන් පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0029 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම :

**කැබලි අංක 230**

ඉඩමේ නම: —; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්. 0.0029.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 නොවැම්බර් මස 27 වැනි දින පෙ. ව. 09.30 ට මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 නොවැම්බර් මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය. හිමිකම් සනාථ කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ ලියකියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

**එස්. පී. කිරිවත්තුඩුව,**
ප්‍රාදේශීය ලේකම්,
මොරටුව.

2025 සැප්තැම්බර් මස 23 වැනි දින,
මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0062